01) වසෙමහි නම සහ අංකය

787 බී වලල්ලාවිට දකුණ

02) හැඳින්වීම

වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය බස්නාහිර පළාතෙහි කලුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ දකුණු භාගයේ දකුණු පළාත් සීමාවේ පිහිටා ඇත. මෙම කොට්ඨාශය අගලවත්ත සහ මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලින් ද දකුණු දෙසින් බෙන්තර මායිම් වන දකුණු පළාත් සීමාවෙන් ද නැගෙනහිරෙන් නියාගම සහ අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලින් ද මායිම් වන වර්ග කිලෝ මීටර් 210.6 කින් යුත් භූමි භාගයකි.

කලුතර දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අතරින් පොදු පහසුකම් ඌණ ග්‍රාමනිලධාරී වසම් 60 කින් සමන්විත විශාලම කොට්ඨාශ වන අතර ඓතිහාසික මෙන්ම පාරිසරික වශයෙන් වැදගත් ස්ථානයක් ගනු ලබයි.

රක්ෂිත වනාන්තර වලින් සහ තෙත් බිම් වලින් ගහනය වූ මෙම කොට්ඨාශය ස්වභාවික සම්පත් සහ විශාල ශ්‍රමබලකායකින් සමන්විත වන අතර යහපත් දේශගුණික තත්වයන්ගෙන්ද යුක්තය.සමස්තයක් වශයෙන් කදු නිම්න සහ තැනිතලා ප්‍රදේශයකින් යුක්තය.

03) වසම පිළිබඳ හැඳින්වීම.

කලුතර දිස්ත්‍රික්කයේ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරී වසම් අතරින් 787 බී වලල්ලාවිට දකුණ ග්‍රාම නිලධාරී වසම

උතුරට - පේර ගහ ඇළ සහ ඔලගොඩ පාර

නැගෙනහිර - බෙන්තර ගඟෙන් ද(පැලවතු ගඟ)

දකුණට - බෙන්තර ගඟෙන් ද

බස්නාහිර - වලල්ලාවිට පාර ද

මායිම් ව පිහිටා ඇති අතර වර්ග කිලෝමීටර 1.5 ක භූමි ප්‍රමාණයක් පුරා පැතිර පවති.මෙම වසමේ මුලු ඉඩම් ප්‍රමාණය අක්කර 379 පමණ වන අතර එය ගොඩ ඉඩම් අක්කර 243 ක් ද මඩ ඉඩම් අක්කකර 136 කින් ද සැදුම්ලත්ය.එසේම මෙහි ප්‍රධාන ගම් වශයෙන්

- බෙරලිය ගොඩදුව ලේදොළ රුක්අත්තන ගහ වත්ත අඹගස්වැල්පළ රාගොඩවෙළ මුඩුවගල ගල්වක පුවක්ගහමුල්ල ගැරඩිවැල්දුව කැකුණගොඩවත්ත

මෙම වසමෙහි ජනගහනය 597 පමණ ජීවත්වන අතර ඔවුන් සිංහල බෞද්ධයෝ සහ මුස්ලිම් දෙමළ අය වෙති.බොහෝවිට මෙම ජනතාව පොදු පහසුකම් අවම කෘෂි කර්මාන්තය ජීවනෝපාය කරගත් ශක්තිසම්පන්න ශ්‍රමබලකායකින් යුක්තය.

මෙම වසමට අයත් භූමි ප්‍රදේශයට වසර පුරාම වර්ෂාපතනය ලැබෙන අතර සාමාන්‍ය උෂ්ණත්වයකින් යුක්ත බැවින් යහපත් දේශගුණික තත්වයක් පවති.එසේම මෙම වසමේ පහත් බිම් සහිත ගම්මාන කිහිපයක් නිතර ගංවතුර ආපදාවයන්ට ද ගොදුරු වනු ඇත.

04) මෙම ග්‍රාමනිලධාරී වසමට අයත් ප්‍රදේශයේ වලල්ලක ආකාරයේ කඳු පන්තියක් යුක්ත ඕවිට වලලුඕවිට නමින් හඳුන්වනු ලැබිණි.පසුකාලීනව වලල්ලාවිට නමින් ජනවහරට එක්වූ බව පැවසේ.වලල්ලාවිට පිළිබඳ කවි පන්තියක් පහත ආකාරයට විග්‍රහ කර ඇත.

මකලන් තිස්ස රජු පෙර එක් සමයකදී

යුධයෙන් පැරදිලා මහ වනයකට වැදී

වටයෙන් වලල්ලක් මෙන් බලකොටුව බැඳී

එ ගමට වලල්ලාවිට යැයි කියන ලදී

මකලන්තිස්ස රජ සමයේදී යුද්ධයෙන් පැරදී මහ වනයකට වැදී වටයෙන් වලල්ලක් ආකාරයෙන් බලකොටුව බැඳි නිසා ඒ ගමට වලල්ලාවිට නම ලැබුණ බව ජනප්‍රවාදයේ සඳහන් වේ.

වසමේ ඓතිහාසික වැදගත්කම

මෙම වසමේ පැලවතු සහ බෙන්තර ගඟ හමුවන ස්ථානයේ බෙල්ලන්කලමුල්ල තොටුපළට බෙන්තර ගඟ දිගේ භාණ්ඩ ප්‍රවාහනයට කරවූ පාරු පැමිණ ඇත.මෙහි ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූයේ මිනිරන් පතල් වල ඇති මිනිරන් ප්‍රවාහනය කිරීමය.අලුත්ගම ප්‍රදේශයෙන් පැමිණි වෙළඳුන් මිනිරන් ලබාගත් මෙහි ජනතාවට අවශ්‍ය වෙනත් භාණ්ඩ ලබාගැනීමේ ප්‍රධාන තොටුපළ ලෙස බෙල්ලන්කලමුල්ල තොටුපළ හඳුන්වාදිය හැකිය.පසුකාලීනව මිනිස් සංහතියේ ක්‍රියාකාරකම්වල අතුරු ප්‍රතිඵලයක් ලෙස මෙම ස්ථානය විනාශමුඛයට පත්ව ඇත.

වසමේ භූමියේ ස්වභාවය

මෙම ග්‍රාමනිලධාරී වසමට අයත් භූමි ප්‍රදේශයේ උස් කඳු බිම් සහ පහත් බිම් වශයෙන් පිහිටා ඇත.උස් කඳු ප්‍රදේශවල ලඳු කැළෑ විශාල ගස් වර්ග සහ විශාල ගල් පිහිටා ඇත.

මැටිසහිත ලෝම පස විශේෂයෙන්ම තේ වගාවට සුදුසු කඛොක් පසට සමාන ගල් කැට සහිත පසක් බොහෝ වට දැකගත හැකිය.ප්‍රදේශයේ භෝග වගාවන් බහුල ලෙසට තේ වගාව පවති.එමෙන්ම කුරුඳු රබර් වී ගොවිතැන පොල් වගාවන්ට සුදුසු පාරිසරික භූමියකින් යුක්තව පිහිටා ඇත.